සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ........................................................ සිංහල භාෂාව හා සාහිත්‍යය - III කාලය : පැය 02යි.

වැදගත් :

- ✳ දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ✳ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

(01) (i) සිට (x) තෙක් සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට අනුග්‍රහය දැක් වූ ඇමතිවරයා කවුරුන් ද?

(ආ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර වූ මුල් කෘතිය කුමක් ද?

(ii) (අ) බලිතොවිල් හා ශාන්තිකර්මවල යෙදුන ජනයා දෙවියන් උදෙසා ගායනා කළ කාව්‍ය විශේෂයක් සඳහන් කරන්න.

(ආ) කෙළි සෙල්ලම් ඇසුරින් නිර්මාණය වූ ජන කවි වර්ගයක් නම් කරන්න.

(iii) (අ) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය ගණන කීය ද?

(ආ) ගුත්තිල කාව්‍යයට මූලාශ්‍ර වූ කෘතිය කුමක් ද?

(iv) ''බෙත් තෙලින් පියා සඟල මැඩ''

(අ) මේ කොටස ඇතුළත් පාඩම කුමක් ද?

(ආ) මේ කොටස ඇතුළත් කෘතිය අයත්වන සාහිත්‍ය යුගය කුමක් ද?

(v) (අ) උපදේශ කාව්‍ය හඳුන්වන තවත් නමක් ලියන්න.

(ආ) ජන කවියේ ආරම්භය පිළිබඳ තොරතුරු සැපයෙන කෘතිය කුමක් ද?

(vi) (අ) Village in the Jungle (විලේජ් ඉන් ද ජංගල්) නව කතාවේ කතුවරයා කවුරුන් ද?

(ආ) ඉහත නව කතාවේ තේමාව කුමක් ද?

(vii) .......................................................................................

.......................................................................................

වරද පෙනෙති වැඩ නුගත් අයට ලොවේ

වරද නැති කෙනෙක් නැති සකිය මේ ලොවේ

(අ) ඉහත කවියේ මුල් පද සම්පූර්ණ කරන්න.

(ආ) සකිය යන්නට සමාන පදයක් ලියන්න.

(viii) (අ) ගුත්තිල කාව්‍ය රචනා වූ අවධියේ විසූ රජතුමා කවුරුන් ද?

(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළ අගමැතිවරයා කවුරුන් ද?

(ix) (අ) ජාතික කතා ඇසුරින් ලියැවුණු ගී කාව්‍ය 2ක් ලියන්න.

(ආ) මහෞෂධ පඬිතුමා සේවය කළේ කිනම් රජතුමාට ද?

(x) (අ) ''සුදු ගෝනා'' කාගේ පරිවර්තන කෘතියක් ද?

(ආ) බැද්දේගම නව කතාවේ සිළිඳුගේ සොහොයුරියගේ නම කුමක් ද? (ලකුණු 2x10=20යි)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ''කොල, බ්‍රහ්මදත්තයන්ගේ පුරුෂයෙනි, **සයින්** නොමියැ තෙල මල කඩා හිස පැලඳ ගෙන **ඇඹුල** දඩු හුයා ගෙන බඩ පුරා කා පියව''

(අ) ඉහත කොටසේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මේ ප්‍රකාශය කළ අය ඉන් පසුව කළේ කුමක් ද?

(ii) **පන් සිළු** වීණා නද පසු බැස් වූ
මන් පිනවන වෙණ නදයෙන් තොස් වූ
නන් දන කැන් දුටුවද බිය සිස් වූ
**මින් රළුවුත්** ගං වෙරළට රැස් වූ

(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කවියේ ම අර්ථය ලියන්න.

(iii) සෝෂා සහිත කලබල වීදිවලින් තැතිගෙන සිටි පුංචි මැණිකා **ජන ශූන්‍ය** නිශ්චල ස්ථානයකට පැමිණීම ගැන **ආනන්දිතව** එහි ඇන තියා හිඳ ගත්තා ය.

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) ඉහත සඳහන් අවස්ථාවෙන් පසු සිදු වීම පේළියකින් පමණ ලියන්න.

(iv) **රන් විමනේ** සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
**මිණි බරණින්** සැදි මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පද්‍යයේ ඇතුළත් ආප්තෝපදේශය උපුටා ලියන්න.

(v) ....... **බඩ බන් කඩ** පමණකටත් **අස්වාමික** කරවා නිගන්ඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහු බඳවා පියමි.

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම අභීත ප්‍රකාශය කළ අවස්ථාව පිළිබඳව කෙටියෙන් ලියන්න.

(ලකුණු 4X5=20යි)

(03) උම්මග්ග ජාතක කතාවෙන්

(i) බෝසත් චරිතයේ ප්‍රඥා මහිමය විදහා දැක්වීමත්

(ii) කේවට්ට චරිතය යොදා ගෙන බමුණු සමාජය උපහාසයට ලක් කිරීමක් සිදු කොට ඇත.

නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ 2 බැගින් දෙමින් මේ කියමන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) අපූර්ව අවස්ථා නිරූපණයත්

(ii) සාර්ථක උපමා භාවිතයත්

යන කරුණු නිසා ගුත්තිල කාව්‍ය සාර්ථක පද්‍ය නිර්මාණයක් වී ඇති අයුරු නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

(04) (i) සරල භාෂා භාවිතයෙන්

(ii) ගැමි ජීවිතය හා බැඳුණු යෙදුම් භාවිතයත්

ජන කවිවල ප්‍රබල ලක්ෂණ වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් 'හානාහීය පානා අඬහැරෙන් දූනේ' පාඩම ඇසුරින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

**නැතහොත්,**

(i) කැලෑබද පිටිසර ගමක් ජන ශූන්‍ය බවට පත් වෙමින් තිබෙන ආකාරයත්,

(ii) ගැමියන් මුහුණ දෙන ජීවන කම්කටොලුත්

බැද්දේගම නව කතාවෙන් ඉස්මතුවන බව එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් නියමිත පාඩම ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

**⁕ අංක 5, 6, 7, ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) ගුත්තිල කාව්‍යයේ කාව්‍යෝපක්‍රම එහි සාර්ථකත්වයට බලපා ඇති ආකාරය ගුත්තිල වෙණ නද පාඩමින් උදාහරණ 3ක් ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) රසවත් සාර්ථක උපමා භාවිතයට ජාතක කතාකරුවා සමතෙකි. සතර කන් මන්ත්‍රණයේ සුදුසු උදාහරණ 3ක් ඇසුරින් ඉහත කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා උපදේශ කාව්‍ය පිටිවහල් කර ගත හැකි අකාරය හානා හීය පානා අඬ හැරෙන් දූනේ පාඩමින් උදාහරණ තුනක් ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)